# කෙලෙහිගුණ සැලකීම



වයි.එම්.එච් දෙව්මිණි රාජකරුණා.

# කෙලෙහිගුණ සැලකීම

වයි.එම්.එච් දෙව්මිණි රාජකරුණා.

කතා

මහමායා බාළිකා විද්‍යාලය

7-D

# කතෘගේ වෙනත් කෘති

- අපේ පුංචි කොණ්ඩ කුරුල්ලා
- මම හොඳ දරුවෙක් වෙමි
- යාළුවාට පාඩමක්
- අහිංසක මුව පැටියා
- අහිංසක බිම්මල
- ගම්බද අසිරිය

# පිදුම

දස මසක් කුස තුළ හොවා මා මෙලොවට තිළිණ කළ ගඟනක් වන් වූ මෑණියන්යන් හට...

දහදිය වගුරුවා කුස ගිනි නිවූ මහ පොළොවක් වූ පියාණන් හට...

සිප් සතර කියා දී යහමඟ පෙන්වූ දිය දහරක් වන් වූ ගුරුවරුන් හට...

රුස්ස ගසක සෙවනක් මෙන් මා හට සෙත සැලසූ සැමට...

පුදමි මෙම කතන්දරය හදපිරි බැතියෙන...



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාෂිංසන පණිවිඩය.

මහනුවර මහමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණය ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළිදැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩකාරවරයා වශයෙන් සුභාෂින්සන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා සුභාෂින්සන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සලකමි.අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම් වන අතර එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වෙයි. සිත දරුවන්ගේ දක්ෂතා නිර්මාණශීලීත්වය සහ බුද්ධිමත් හැකියාවෙන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවී ඉතා ප්‍රශංසනීය බව පැහැදිලි වේ. මෙම ග්‍රන්ථකරණය ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දයාවක්ද ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම මෙවැනි උත්සාහයන් තුළින් අනාගතය ශ්‍රී ලංකාවේ අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි. මෙම සාර්ථක කටයුතු සඳහා කැපවූ විදුහල්පතිය ගුරු මණ්ඩලයේ සිසුන් දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමින්ම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථයේ දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබාදෙනු ඇතැයි ප්‍රාර්ථනා කරමි. .

. සරත්. බී. එස්. අබේකෝන්.

**ආණ්ඩුකාරවර මධ්‍යම පළාත.**

සම්මානනීය මහාචාර්ය,පේරාදෙණි විශ්ව විද්‍යාලය

.2026 .05.10.

# සුභාෂිංසන පණිවිඩය.


වත්මන් පාසල් පද්ධතිය තුළ දූදරුවන් ග්‍රන්ථ ගණනයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහමායා බාලිකා විද්‍යාලයි මූලිකත්වයෙන්ම මහනුවර කලාපයේ සෙසු පාසල් වලට සහභාගිත්වයෙන් මෙවර පරමම මහනුවර කලාපයේ සෙසු පාසල් වලට සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩම කළ හේම මාලා කුමරියට උපහාර පිණිසම මහනුවර කලාපයේ සෙසු පාසල් වලට සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩම කළ හේම මාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ ඉරිදැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහමා බාලිකා විද්‍යාලම මහනුවර කලාපයේ සෙසු පාසල් වලට සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩම කළ හේම මාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ ඉරිදැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය ශිෂ්‍ය දියණිවරුන්. සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙමම ව්‍යාපෘතිය ක් සැලසුම් කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයන්තය අතිශය අගය කරමින්. ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස් අනිවාර්ය ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබාදීමට එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණය පුරවැසියන් පරපුරක් බිහි කිරීමටත් කැප වී සිටි එවන් පසුබිමක. සුසමාහිත වූ සමබර. පෞරුෂයක් සඳහා. නිර්මාණය. හැකියාව. විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථය කරන වැඩසටහන හේතු පාදකවේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණය ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රතිප් නිලංග දැල,

දියවඩන නිලමේ, . ශ්‍රී දළදා මාලිගාව.2026.05.10




එකමත් එක කාලෙක එක ගමක ඉතාමත් දක්ෂ දඩයක්කරුවෙකු සිටියා. මොහු දඩයම් කිරීමට නිතරම විෂ කවන ලද ඊතල තමාගේ පිටේ එල්ලා ගෙන ගියා. එක දවසක් මොහු මුවෙකුට විෂ ඊතලයකින් විද්දා.



එත් ඊතලයේ කුරුමානම වැරදිලා ඉතා විශාල රුක්ෂ ගසකට ඇනුණා. දින කීපයක් ගත වුණා. ඊතලයේ තිබූ විෂට ගස මැලවී ගොස් ගසේ කොළ, මල්, ගෙඩි බිම වැටුණා.

මේ ගසේ බෙනයක ගිරවෙක් වාසය කළා. ගස මැරි ගියත් ගිරවා නම් බෙනය දාලා ගියේ නෑ. ගිරවා ඉතාමත් කණගාටුවෙන් කාලය ගත කළා.





මේ තොරතුර දෙව් ලොව සිටි දෙවිවරුන්ට ආරංචි වුණා. ඉන් එක දෙවිවරයෙක් බමුණේකු ලෙස වෙස් වලා ගෙන ගිරවා සිටි මැරුණු ගස ගාවට ආවා.



ඇවිත් මෙසේ කිව්වා,

“ඇයි ඔබ ඉතාමත් දුකෙන් ඉන්නේ..... ඇයි මේ මැරිච්ච ගසට වෙලා ඉන්නේ..... මේ මහා විශාල කැළයේ කොච්චර නම් ගස් තියෙනවද?”

එවිට ගිරවා මෙසේ කිව්වා,



“අවසරයි බමුණාණෙනි ! මේ ගසේ තමයි මා උපන්නේ... හැදූනේ වැඩුනේ ... මුලින්ම පියාසර කිරීමට උගත්තේ...මාගේ මව් පියන් උපන්නේ ...



එතරම් අපට සමීප මේ ගස අපව ආරක්ෂා කර ගත්තා.... කෙසේද මා මේ ගස ලෙඩකදී දුකකදී දමා යන්නේ !



ඉතින් ඔබ හිතනවා ද මා මේ ගස දමා යන එක හොදයි කියා.... අන්න ඒ නිසයි මා මේ ගස දමා නොයන්නේ ”



මේ කතාව අසා බමුණුවෙස් ගත් ශක්‍රදේවෙන්ද්‍රයා හරිම සතුටට පත් වුණා. “ඔබ  හරිම හොදයි! ඔබ කාටත් ආශීර්වාදයක් ! ඔබට ඉතා බලගතු වරයක් දෙන්නම් ඔබ ඕනෑම දෙයක් මගෙන් ඉල්ලන්න”



ගිරවා මදක් කල්පනා කර “හොදයි එසේ නම් මේ ගසට නැවත නැවත ජීවය ලබා දෙන්න” යැයි ඉල්ලා සිටියා . බමුණා ඉතා ඉක්මනින් මේ ගසට නැවත ජීවය ලබා දුන්නා. එතැන් පටන් මේ ගිරවා සතුටින් ජීවත් වුණා.

# පසුවදන



අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් හේමමාලා උපහාරඃ ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මුලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.